සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර II විභාගය - 2026 ජනවාරි

(201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2026-02-07
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
උත්තර ලිවීම සඳහා - පැය 03 යි.

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

A කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.5** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 **සීමාසහිත ඇත් සමාගම,** 2023 ජනවාරි 01 දින, පිරිවැය රු.2,500,000/- ක් වූ යන්ත්‍රයක් අත්පත් කරගන්නා ලදී. එම යන්ත්‍රයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 ක් වන අතර, 5 වන වසර අවසානයේදී සුන්බුන් අගය රු.500,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. 2025 මාර්තු 31 දිනට, යන්ත්‍රයේ ධාරණ අගය වන්නේ:

(1) රු.1,500,000/-. (2) රු.1,600,000/-.

(3) රු.1,375,000/-. (4) රු.1,100,000/-. (ලකුණු 02)

1.2 මූල්‍ය වර්ෂය සඳහා වන වාර්තා කිරීමේ දිනය (2025 මාර්තු 31) සහ මූල්‍ය ප්‍රකාශන නිකුත්කිරීම සඳහා අනුමැතිය ලද දිනය (2025 මැයි 15) අතර සිදුවූ පහත සඳහන් සිදුවීම් සලකා බලන්න. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 - වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු සිදුවීම් අනුව, පහත සඳහන් ඒවා අතුරෙන්, ගැලපිය යුතු සිදුවීමක් වන්නේ කුමක් ද?

(1) 2025 මාර්තු 31 දිනට මුදල් ලැබිය යුතු ගනුදෙනුකරුවෙකු, 2025 අප්‍රේල් 05 දින, බුන්වත් ලෙස ප්‍රකාශ කරන ලදී.

(2) 2025 අප්‍රේල් 02 දින, ගින්නකින් විශාල නිෂ්පාදන පිරියතක් විනාශ වීම.

(3) 2025 මැයි 15 දින, ප්‍රධාන කොටස් නිකුතුවක් පිළිබඳ නිවේදනය කිරීම.

(4) 2025 අප්‍රේල් 18 දින, ආයෝජනයක වෙළෙඳපොළ වටිනාකමේ අඩුවීම. (ලකුණු 02)

1.3 **සීමාසහිත රතා සමාගමේ** ගිණුම් පොත්වලින්, 2025 දෙසැම්බර් මාසයට අදාල පහත සඳහන් අගයන් උපුටා ගන්නා ලදී:

	රු.
දළ වැටුප	7,800,000
අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද [Advanced Personal Income Tax (APIT)]	660,000

සමාගම, දළ වැටුපෙන් 12% ක් සේවක අර්ථසාධක අරමුදලට [Employees' Provident Fund (EPF)] සහ 3% ක් සේවක භාරකාර අරමුදලට [Employees' Trust Fund (ETF)] දායක වන අතර, සේවක අර්ථසාධක අරමුදලට සේවකයින් 8% කින් දායක වේ.

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2025 දෙසැම්බර් මාසය සඳහා ශුද්ධ වැටුප වූයේ:

(1) රු.5,911,000/-. (2) රු.7,140,000/-. (3) රු.5,340,000/-. (4) රු.6,516,000/-.

(ලකුණු 02)

1.4 **සීමාසහිත XYZ සමාගම,** කුලී පදනම මත ගොඩනැගිලි දෙකක් ලබාගෙන ඇත. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමාගම, කුලිය ලෙස රු.2,400,000/- ක් ගෙවා තිබේ.

සීමාසහිත XYZ සමාගමේ ගිණුම් පොත්වල පහත ශේෂයන් පෙන්නුම් කරන ලදි: *(රු.)*

	2025 මාර්තු 31 දිනට	2024 අප්‍රේල් 01 දිනට
ගෙවිය යුතු බදු කුලී	240,000	180,000
ඉදිරියට ගෙවූ බදු කුලී	175,000	225,000

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවැරදි කුලී වියදම වූයේ:

(1) රු.2,510,000/-. (2) රු.2,290,000/-. (3) රු.2,400,000/-. (4) රු.2,625,000/-.

(ලකුණු 02)

1.5 **සීමාසහිත Mark පොදු සමාගමේ , A ද්‍රව්‍ය** ට අදාලව, පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

උපරිම භාවිතය	කිලෝග්‍රෑම් 400
අවම භාවිතය	කිලෝග්‍රෑම් 200
පොරොත්තු කාලය	මාස 2 - 6
යළි ඇණවුම් ප්‍රමාණය	කිලෝග්‍රෑම් 1,500

A ද්‍රව්‍යයෙහි යළි ඇණවුම් මට්ටම වන්නේ:

(1) කිලෝග්‍රෑම් 400. (2) කිලෝග්‍රෑම් 800. (3) කිලෝග්‍රෑම් 1,200. (4) කිලෝග්‍රෑම් 2,400.

(ලකුණු 02)

*අංක **1.6** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.6 මූල්‍ය ප්‍රකාශනවල සංරචක (components) දෙකක්(02) හඳුනා දක්වන්න. (ලකුණු 02)

1.7 කාල ගෙවීම් ක්‍රමයක (time rate remuneration system) වාසි තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

1.8 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ, 24 වැනි වගන්තියේ ඇති ප්‍රතිපාදන තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

1.9 **සීමාසහිත Synergy (පෞද්ගලික) සමාගම,** එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. පහත සඳහන් තොරතුරු, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා අදාල වේ:

	රු.
2025 ඔක්තෝම්බර් 01 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ බැර ශේෂය	52,500
විකුණුම් (එකතු කළ අගය මත බදු රහිතව)	1,200,000
ගැනුම් (එකතු කළ අගය මත බදු රහිතව)	550,000
විකුණුම් ආපසු එවුම් (එකතු කළ අගය මත බදු රහිතව)	65,000

(සියළුම මිලදී ගැනුම් සහ විකුණුම්, බදු ඉන්වොයිසි මගින් තහවුරු කරන අතර, අදාල එකතු කළ අගය මත බදු අනුපාතය 18%.)

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව,

2025 දෙසැම්බර් 31 දිනට, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT) ගිණුමේ ශේෂය ගණනය කරන්න.

(ලකුණු 03)

1.10 පහත සඳහන් තොරතුරු, **සීමාසහිත ලංකා සමාගමේ, කාර්යය අංක 205** ට අදාලව උපුටා ගන්නා ලදී:

සෘජු ද්‍රව්‍ය	කිලෝග්‍රෑමයක් රු.150/- බැගින් කිලෝග්‍රෑම් 150 ක්
සෘජු ශ්‍රමය	පැයකට රු.600/- බැගින් පැය 75 ක්
නිෂ්පාදන පොදුකාර්ය - **Q** දෙපාර්තමේන්තුව	සෘජු ශ්‍රම පිරිවැය මත 150%
- **R** දෙපාර්තමේන්තුව	සෘජු ශ්‍රම පිරිවැය මත 60%

සමාගම, විකුණුම් මිල මත 20% ක ලාභයක් පවත්වාගෙන යයි.

කාර්යය අංක 205 මත අයකළ යුතු මිල ගණනය කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 50)

02 වන ප්‍රශ්නය

තිලක් විසින් 2024 ජනවාරි 01 දින, රු.2,000,000/- ක් මුදලින් ආයෝජනය කරමින් **තිලක් කේටරින්** නමින් එළිමහන් ආහාර සැපයුම් සේවා (outdoor catering services) ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

කෙසේවුවද, ඔහු විසින් නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන ගොස් නොමැති අතර, පහත සඳහන් තොරතුරු 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයෙන් උපුටාගන්නා ලදී:

(1) ව්‍යාපාරයේ අනෙකුත් වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ: *(රු.)*

දිනට	2025 දෙසැම්බර් 31	2025 ජනවාරි 01
යන්ත්‍ර - ධාරණ අගයට	1,800,000	2,200,000
වෙළෙඳ ණයගැතියෝ	670,000	480,000
තොග	17,500	16,300
මුදල් සහ බැංකු ශේෂ	?	1,530,000
වෙළෙඳ ණයහිමියෝ	720,000	630,000
උපචිත විදුලිය සහ ජලය	5,300	6,200

(2) 2025 වර්ෂය තුළදී, දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් මිලටගෙන හෝ ඉවත්කොට නොමැත.

(3) සියළුම විකුණුම් සහ ගැනුම් ණය පදනමට සිදුකර ඇති අතර, වර්ෂය තුළදී සිදුකළ මිලදී ගැනුම් රු.3,200,000/- කි. 2025 වර්ෂය තුළදී, වෙළෙඳ ණයගැතියන්ගෙන් රු.9,600,000/- ක මුදලක් එකතු කරගන්නා ලදී.

(4) ආරම්භයේදී, ව්‍යාපාරය **තිලක්ගේ** නිවසේ පවත්වාගෙන ගිය අතර, එය පුළුල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2025 ජූලි 01 දින සිට කුලියට ගත් පරිශ්‍රයකට මාරුවී තිබේ. කුළී ගිවිසුම අත්සන් කළ 2025 ජූලි 01 දින, වසර දෙකක කුලිය ලෙස රු.720,000/- ක් ගෙවා ඇත.

(5) වර්ෂය තුළදී, විදුලිය සහ ජලය සඳහා කරන ලද ගෙවීම් රු.96,000/- කි.

(6) ව්‍යාපාරය සඳහා පූර්ණකාලීන සේවකයින් දෙදෙනෙකු යොදවා ඇත. එක් සේවකයෙකුට රු.60,000/- බැගින් වන මාසික වැටුපක් හිමි වේ. වැටුපට අමතරව, වසර තුළදී ණයගැතියන්ගෙන් එකතු කරගත් මුදල් මත, 10% ක් දිරි දීමනා වශයෙන් සේවකයින්ට ගෙවා ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

තිලක් කේටරින් සඳහා පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ ලාභය. (ලකුණු 07)

(b) 2025 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන (ස්කන්ධ) ශේෂය. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

03 වන ප්‍රශ්නය

හිලාන්, තිලාන් සහ ඩිලාන්, HND ඇසෝසියේට්ස් හි හවුල්කරුවන් වේ.

(1) හවුල් ගිවිසුමේ පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- **හිලාන්, තිලාන්** සහ **ඩිලාන්** පිළිවෙලින් ලාභා'ලාභ 2 : 2 : 1 අනුපාතයට බෙදාගනු ලැබේ.
- 2025 ජනවාරි 01 දිනට පැවති ආරම්භක ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් මත, 10% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන්ට හිමිකමක් තිබේ.
- හවුල් ව්‍යාපාරය කළමනාකරණය කිරීම සඳහා, **ඩිලාන්** රු.25,000/- ක මාසික වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.

(2) 2025 ජනවාරි 01 දිනට, හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත සඳහන් ශේෂයන් උපුටාගෙන ඇත:

(රු.'000)

	හර	බැර
ප්‍රාග්ධන ගිණුම් ශේෂ:		
හිලාන්		8,000
තිලාන්		8,000
ඩිලාන්		4,000
ජංගම ගිණුම් ශේෂ:		
හිලාන්	200	
තිලාන්		800
ඩිලාන්	200	

(3) 2025 දෙසැම්බර් 31 දින, **ඩිලාන්** හවුල් ව්‍යාපාරයෙන් ඉවත්වීමට තීරණය කළ අතර, **හිලාන්** සහ **තිලාන්** ලාභා'ලාභ සමානව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය එම නමින්ම පවත්වාගෙන යාමට එකඟ වුණි. එදිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.3,000,000/- කට අගය කරන ලදී. කීර්තිනාම ගිණුමක් විවෘත නොකර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුලින් කීර්තිනාමය ගැලපීමට තීරණය කරන ලදී.

(4) 2025 දෙසැම්බර් 31 දිනට, හවුල් ව්‍යාපාරයේ පැවති ජංගම නොවන වත්කම් පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී: *(රු.'000)*

	පිරිවැය	2025 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය	2025 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කළ අගය
ඉඩම් සහ ගොඩනැගිලි	6,000	200	6,500
මෝටර් වාහන	2,000	500	2,600

ජංගම නොවන වත්කම්, හවුල්කරුවන්ගේ ගිණුම් පොත්වල ප්‍රත්‍යාගණන කළ අගයට පවත්වාගෙන යාමට තීරණය කරන ලදී.

(5) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.3,190,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **HND ඇසෝසියේට්ස්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 05)

(b) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

04 වන ප්‍රශ්නය

ඇඟළුම් නිෂ්පාදන සමාගමක් වන **සීමාසහිත හැමිල්ටන් පොදු සමාගම**, තම සේවකයින්ගේ සුභසිද්ධිය උදෙසා **"හැමිල්ටන් සුභසාධන සංගමය"** නමින් සේවක සුභසාධක සංගමයක් පිහිටුවා ඇත.

හැමිල්ටන් සුභසාධන සංගමය නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් නොමැත. කෙසේවුවද, **හැමිල්ටන් සුභසාධන සංගමයේ** ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු එක්රැස් කරගැනීමට සමත් විය:

(1) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **හැමිල්ටන් සුභසාධන සංගමයේ** ලැබීම් සහ ගෙවීම් පහත සඳහන් පරිදි වේ:

ලැබීම්:	රු.
සාමාජිකයින්ගෙන් ලද සාමාජික ගාස්තු	2,440,000
සීමාසහිත හැමිල්ටන් පොදු සමාගමෙන් නත්තල් සාදය සඳහා ලද දායකත්වය	1,100,000
නත්තල් සාදය සඳහා සාමාජිකයින්ගෙන් එකතු කළ මුදල	900,000
නත්තල් සාදය සඳහා ලද අනුග්‍රහයන්	750,000
ගෙවීම්:	
සාමාජිකයින්ගේ පවුල්වල අවමගුල් සඳහා	20,000
සාමාජිකයින්ගේ මංගල උත්සව සඳහා	50,000
හෝටල් ගාස්තු (නත්තල් සාදය)	1,950,000
සංගීත කණ්ඩායම (නත්තල් සාදය)	75,000
නත්තල් සාදයේ තෑගි සඳහා	120,000
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය වියදම්	52,000
මිලදී ගත් ලැප්ටොප් පරිගණකය	200,000

(2) 2025 ජනවාරි 01 දිනට, සංගමයේ පැවති මුදල් සහ බැංකු ශේෂය රු.3,500,000/- ක් වූ අතර, වර්ෂය තුළ ස්ථාවර තැන්පතුවලින් රු.230,000/- ක පොලී ආදායමක් උපයා ඇත.

(3) මාසයක් සඳහා සාමාජික ගාස්තුව රු.1,000/- කි. 2025 ජනවාරි 01 දිනට, සාමාජිකයින් 5 දෙනෙකු, 2024 වර්ෂයේ මාස 2 ක් සඳහා සාමාජික ගාස්තු ගෙවා නොමැත. කෙසේවුවද, 2025 ජනවාරි 01 දිනට, පැවති හිඟ ගාස්තු 2025 වර්ෂය තුළදී ගෙවා ඇත. තවද, 2024 දෙසැම්බර් මාසයේදී, සාමාජිකයින් 15 දෙනෙකු 2025 ජනවාරි මාසය සඳහා අදාල සාමාජික ගාස්තු ගෙවා ඇත.

(4) 2025 දෙසැම්බර් තුළදී, සාමාජිකයින් 25 දෙනෙකු විසින් 2026 ජනවාරි මාසයට අදාල සාමාජික ගාස්තු, කලින් ගෙවා ඇත.

(5) 2025 ජනවාරි 01 දිනට, සංගමයේ සාමාජිකයින් 200 ක් සිටි අතර, සාමාජික ගාස්තු ගෙවමින් 2025 දෙසැම්බර් තුළ සාමාජිකයින් 20 දෙනෙකු අළුතින් සංගමයට බැඳී ඇත.

(6) 2025 ජුලි 01 දින, **හැමිල්ටන් සුභසාධන සංගමය** විසින් ලැප්ටොප් (laptop) පරිගණකයක් මිලට ගත් අතර, එහි ප්‍රයෝජනවත් ආයු කාලය, වර්ෂ 5 කි.

(7) 2025 වර්ෂය තුළදී, **හැමිල්ටන් සුභසාධන සංගමය** විසින් නත්තල් සාදයක් සංවිධානය කල අතර, මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය වියදමින්, 20% ක් නත්තල් සාදය සඳහා වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **හැමිල්ටන් සුභසාධන සංගමයෙහි** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) සාමාජික ගාස්තු ගිණුම. (ලකුණු 04)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

05 වන ප්‍රශ්නය

(a) **Y002 නිෂ්පාදිතයට** අදාලව, 2025 මාර්තු මාසය සඳහා වන පහත සඳහන් තොරතුරු **සීමාසහිත තුෂාර (පෞද්ගලික) සමාගමෙන්** උපුටාගෙන ඇත:

දිනය	විස්තරය	ප්‍රමාණය (ඒකකවලින්)	ඒකකයක මිල (රු.)
2025.03.01	ආරම්භක ශේෂය	4,000	50
2025.03.05	ගැනුම්	5,000	47
2025.03.11	නිකුත් කිරීම්	2,600	-
2025.03.19	ගැනුම්	3,000	52

ඔබ විසින් කළ යුතු දෑ:

භරිත සාමාන්‍ය මිල ක්‍රමය [Weighted Average Cost (AVCO)] යොදා ගනිමින්, 2025 මාර්තු මාසයට අදාලව **Y002 නිෂ්පාදිතය** සඳහා තොග ලෙජරය **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(b) **සීමාසහිත Sunshine (පෞද්ගලික) සමාගම,** අසංකලිත ගිණුම් පද්ධතියක් (a non-integrated accounting system) පවත්වාගෙන යයි. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිරිවැය ගිණුම්වල පෙන්නුම් කරන ලාභය රු.220,800/- ක් වූ අතර, මූල්‍ය ගිණුම් අනුව ලාභය, රු.244,800/- ක් විය.

වෙනස්කම සඳහා හේතු, පහත සඳහන් පරිදි වේ:

(1) තොග අගය කිරීම: *(රු.)*

	පිරිවැය ගිණුම්වලට අනුව	මූල්‍ය ගිණුම්වලට අනුව
ආරම්භක තොගය	225,000	216,000
අවසාන තොගය	195,000	208,000

(2) වෙනත් සමාගමකින් ලද රු.18,000/- ක ලාභාංශ ආදායම, මූල්‍ය ගිණුම්වල පමණක් සටහන් කර ඇත.

(3) රු.21,000/- ක නෛතික වියදම, මූල්‍ය ගිණුම්වල අයකර ඇති නමුත්, පිරිවැය ගිණුම්වල එය වාර්තා කර නොමැත.

(4) පිරිවැය ගිණුම් අනුව, කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය රු.620,000/- ක් වූ අතර, මූල්‍ය ගිණුම්වල එය රු.615,000/- ක් ලෙස සටහන් කර ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

මූල්‍ය ගිණුම් සහ පිරිවැය ගිණුම් අතර, ලාභ සංසන්දනය කිරීමේ ප්‍රකාශනයක් **පිළියෙල කරන්න.** (ලකුණු 05)
(මුළු ලකුණු 10)

06 වන ප්‍රශ්නය

(a) නිෂ්පාදන සමාගමක් වන **සීමාසහිත Smart (පෞද්ගලික) සමාගමට** නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් (2) **(A** සහ **B)** සහ එක් (1) සේවා දෙපාර්තමේන්තුවක් **(C)** ඇත.

(1) සමාගම විසින් පහත සඳහන් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ඇස්තමේන්තුගත කර ඇත:

පිරිවැය අයිතමය	(රු.)
යන්ත්‍ර ක්ෂය	1,800,000
කුලිය	600,000
විදුලිය	900,000
තත්ත්ව පාලන වියදම්	450,000

(2) පහත සඳහන් අතිරේක තොරතුරු ද ඔබට සපයා ඇත:

පදනම	නිෂ්පාදන දෙපාර්තමේන්තු		සේවා දෙපාර්තමේන්තුව	එකතුව
	A දෙපාර්තමේන්තුව	B දෙපාර්තමේන්තුව	C දෙපාර්තමේන්තුව	
වක්‍ර ද්‍රව්‍ය පිරිවැය (රු.'000)	360	270	180	810
යන්ත්‍රවල වටිනාකම (රු.'000)	1,500	2,500	500	4,500
බිම් ප්‍රමාණය (වර්ග අඩි)	500	300	400	1,200
විදුලි පරිභෝජනය (කිලෝවොට්)	400	300	200	900
තත්ත්ව පරීක්ෂණ ගණන	20	10	15	45
පිරිවැය විභජනය - **C දෙපාර්තමේන්තුව**	65%	35%	-	-

ඔබ විසින් කළ යුතු දෑ:

එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා, පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරනු ලබන්නේ කෙසේදැයි දැක්වෙන ප්‍රකාශනයක් **පිළියෙල කරන්න.** (ලකුණු 07)

(b) **C005 ද්‍රව්‍ය** ට අදාලව, පහත සඳහන් තොරතුරු **සීමාසහිත Ceylon Clothing (පෞද්ගලික) සමාගමේ** පොත්වලින් උපුටාගන්නා ලදී:

ඒකකයක ගැනුම් මිල	රු.120/-
ඒකකයක් වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය	ගැනුම් මිලෙන්, 10% ක්
වාර්ෂික ඉල්ලුම	වසරකට ඒකක 100,000
ඇණවුම් කිරීමේ පිරිවැය	ඇණවුමක් සඳහා රු.34,560/-

ඉහත තොරතුරු මත පදනම්ව,

C005 ද්‍රව්‍යයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)] **ගණනය කරන්න.** (ලකුණු 03)
(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 25)

07 වන ප්‍රශ්නය

සීමාසහිත Asia (පෞද්ගලික) සමාගමේ 2025 මාර්තු 31 දිනට, ශේෂ පිරික්සුම පහත පරිදි වේ: (රු.)

	හර	**බැර**
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000)		22,000,000
2024 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම්		5,670,000
පිරියත සහ උපකරණ, පිරිවැයට:		
මෝටර් වාහන	19,500,000	
කාර්යාල උපකරණ	2,550,000	
2024 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය:		
මෝටර් වාහන		6,000,000
කාර්යාල උපකරණ		1,020,000
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	10,410,910	
වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල්	16,037,000	1,225,000
2024 අප්‍රේල් 01 දිනට, වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය		1,500,000
විකුණුම්		42,040,000
විකුණුම් පිරිවැය	16,770,000	
ගෙවූ කාර්යාල කුලිය	1,233,000	
ප්‍රවාහන සහ ගමන් වියදම්	432,250	
අලෙවිකරණ සහ ප්‍රචාරණ වියදම්	725,300	
විකුණුම් කොමිස්	1,006,200	
ජලය සහ විදුලිය	338,000	
2025 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට	6,500,000	
වැටුප්, සේවක අර්ථසාධක අරමුදල [Employees' Provident Fund (EPF)] සහ සේවක භාරකාර අරමුදල [Employees' Trust Fund (ETF)]	7,038,600	
බැංකු ගාස්තු	12,250	
වෙනත් පරිපාලන වියදම්	89,240	
ගෙවූ ආදායම් බදු	825,000	
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවක භාරකාර අරමුදල් (ETF)		12,750
මෝටර් වාහන ඉවත් කිරීමේ ගිණුම		4,000,000
	83,467,750	**83,467,750**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනට, තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.5,950,000/- ක් විය.

(2) 2025 ජනවාරි 01 දින, සමාගම විසින් කාර්යාල ගොඩනැගිල්ලක් වසර 3 ක් සඳහා කුලියට ගත් අතර, එහි මාසික කුලිය රු.137,000/- ක් වන අතර, මාසික කුලියට අමතරව, මාස 6 ක කුලී, වර්ෂය තුලදී කලින් ගෙවන ලදී. සමාගම විසින් අදාල සියළුම කුලී ගෙවීම්, ගෙවූ කාර්යාල කුලී ගිණුමට හර කර ඇත.

(3) 2025 මාර්තු මාසයට අදාල විදුලි බිල රු.27,500/- ක් වන අතර, එය තවමත් ගිණුම්ගත කර නොමැත.

(4) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

මෝටර් වාහන	වර්ෂ 4
කාර්යාල උපකරණ	වර්ෂ 5

(5) 2024 ජනවාරි 01 දින, රු.3,600,000/- කට මිලට ගත් මෝටර් වාහනයක් 2025 ජනවාරි 01 දින රු.4,000,000/- කට විකුණන ලදී. විකිණීමෙන් ලද මුදල්, මෝටර් වාහන ඉවත් කිරීමේ ගිණුමට බැර කර ඇති අතර, එයට අමතරව මෙම මෝටර් වාහනය ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නොමැත. එදිනම සමාගම විසින් නව මෝටර් වාහනයක් රු.7,500,000/- කට මිලටගෙන ඇති අතර, එය නිවැරදිව මෝටර් වාහන ගිණුමට හර කර ඇත.

(6) 2024/25 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු.1,528,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. වර්ෂය තුලදී, සමාගම විසින් ආදායම් බදු, කාර්තුමය වාරික වශයෙන් රු.825,000/- ක් ගෙවා ඇත.

(7) ගනුදෙනුකරුවෙකුගේ මරණය හේතුකොටගෙන රු.450,000/- ක මුදලක්, බොල් ණය ලෙස ලියා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී. තවද, 2025 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට සමාගම තීරණය කරන ලදී.

(8) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, 2025 මැයි 30 දින ලබා දී ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

සීමාසහිත Asia (පෞද්ගලික) සමාගමේ කළමනාකාරිත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 14)

(b) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 11)

(මුළු ලකුණු 25)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
දැනුම (1)	තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම	**අඳින්න**	හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම.
		සම්බන්ධ කරන්න	තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම.
		සඳහන් කරන්න	ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.
		හඳුනා දක්වන්න	සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම.
		ලැයිස්තුගත කරන්න	විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
අවබෝධය (2)	අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම.	**හඳුනාගන්න**	අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම.
		අර්ථකතනය කරන්න	වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න.
		විස්තර කරන්න	ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න.
		පැහැදිලි කරන්න	අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම.
		නිර්වචනය කරන්න	ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
භාවිතය (3)	අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම.	**සසඳන්න**	තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න.
		ප්‍රස්තාර දක්වන්න	ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න.
		තක්සේරු කරන්න	වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න.
		විසඳන්න	ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම.
		පිළියෙල කරන්න	විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම.
		ප්‍රදර්ශනය කරන්න	උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම.
		ගණනය කරන්න	ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම.
		භාවිත කරන්න	ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
විශ්ලේෂණය (4)	අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම.	**සන්නිවේදනය කරන්න**	තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම.
		සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.
		අසමානතා බලන්න	අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම.
		සමානකම් බලන්න	සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම.
		විමසන්න	තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම.
		වෙනස්කොට දක්වන්න	යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම.
		විශ්ලේෂණය කරන්න	විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න.